සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/DG/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2020.04.06

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සමෘද්ධි මූලස්ථාන කළමනාකරු,
සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා බැංකු කළමනාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරි,
සමෘද්ධි බැංකු සමිති සභාපති හා බැංකු සභාපති

**උද්ගතවී ඇති ව්‍යවසනකාරී තත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු. 5,000/- දීමනාවක් ගෙවීම**

උක්ත ශීර්ෂය යටතේ ඉහත සමාංක දරණ 2020.04.02 දිනැති චක්‍රලේඛයට අනුව සමෘද්ධි සහනාධාර හිමිකම් නොලබන පොරොත්තු ලේඛනයේ සිටින අඩු ආදායම්ලාභී පවුල් සඳහාත්, නව කොරෝනා වෛරසය (Covid-19) නිසා ආර්ථික පසුබෑමට ලක්ව ඇති ජනකොටස් සඳහාත් රුපියල් 5,000/- (පන් දහස) ක සමාජ ප්‍රතිලාභ දීමනාව, සමෘද්ධි බැංකු මඟින් විධිමත් ලෙස ගෙවීමට අදාළව මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ඇත.

02. මෙම කාර්යට අදාළව පත්කරන ලද ග්‍රාමීය කමිටුවේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර, දිස්ත්‍රික් ලේකම් විසින් සහතික කර එවන ලද ලේඛනයට අනුව අදාළ මූල්‍ය ප්‍රතිපාදන හා අක් මුදල් කලාප මට්ටමින් සමෘද්ධි බැංකුවට අයත් ජංගම ගිණුමට ප්‍රේෂණය කර ඇත. පොරොත්තු ලේඛනයේ සිටින අනුමත වූ අඩු අදායම්ලාභී පවුල් සඳහා මෙම සමාජ ප්‍රතිලාභ දීමනා ගෙවීම් කිරීමට 2020.04.07 දින සිට ආරම්භ කල යුතුය. අනිකුත් අදාළ අනුමත ලේඛන ලද පසු ඉතිරි අයටද කඩිනමින් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

03. මෙසේ සමාජ ප්‍රතිලාභ දීමනා ලෙස ප්‍රේෂණය කරන ලද මුදල් පහත පරිදි පැවරුම් හර / බැර භාවිතා කර සමෘද්ධි බැංකුවේ ගිණුම් තැබිය යුතුය.

| | |
|---|---|
| ජංගම ගිණුම | හර |
| අඩු අදායම්ලාභී පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුම (කේත අංකය 4056) | බැර |

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

04. සමෘද්ධි බැංකුවට ප්‍රේෂණය කරන ලද මුදල, මාර්ගස්ථ මුදල් රක්ෂණ ආවරණය යටතේ එක් අවස්ථාවකදී රුපියල් 5,000,000/- (මිලියන පහ) බැගින් ගෙනඒමට හැකියාව ඇත. අවශ්‍යතාවය පරිදි බැංකු කළමනාකරු, සහකාර කළමනාකරු හා මුදල් අයකැමි යන අයට මුදල් ගෙන ඒමේ අවස්ථාව වෙන වෙනම හිමි වන අතර, දෛනික මුදල් අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන අවස්ථා කිහිපයකදී මෙම මුදල් රැගෙන යා හැකිය. තම අවශ්‍යතාවය මත ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශීය බැංකුව මඟින් මුදල් ලබා ගැනීමේදී අදාළ ශාඛා කළමනාකරුවන් සමඟ සාකච්ඡා කර කඩිනම් ක්‍රම වේදයක් සකස් කර ගැනීමට පියවර ගත යුතුය.

05. ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සකස්කරන ලද අනුමත ලේඛනයට අනුව, සමෘද්ධි බැංකුව විසින් සමෘද්ධි සංවර්ධන නිලධාරියා වෙත මුදල් නිදහස් කිරීමේ දී, පොදු ලෙජරයේ "අඩු අදායම්ලාභී පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුමට" හර පිණිස ලියන ලද "මුදල් හර" පත්‍රයක් සම්පූර්ණ කර අදාළ මුදල් භාරගත් බවට අත්සන් ලබාගත යුතුය. එක් වාරයකදී රුපියල් 500,000/- (ලක්ෂ පහ) ක උපරිමයකට යටත්ව, දිනකට අවශ්‍ය මුදල් වාර කීපයක දී වුවද රැගෙන යා හැකිය. මාර්ගස්ථ මුදල් රක්ෂණ ආවරණය මේ සඳහා අදාළ වේ.

06. අනුමත ලේඛනයට අනුව අදාළ ඉල්ලුම් කරුවන් වෙත සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසින් එක් වරක් පමණක් ගෙවනු ලබන රුපියල් 5,000/- (පන්දහස) මුදල ක්ෂේත්‍රයේ ගෙවීමේදී CR පොතක නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය ලබාගත් මුදල සටහන් කර අත්සන් ලබා ගත යුතුය. එක් පවුලකට එක්වරක් පමණක් ගෙවනු ලබන මෙම සමාජ ප්‍රතිලාභ දීමනාව එක් අවස්ථාවකින් පමණක් හිමිවිය යුතු බවට අවධානය යොමු කර, ගෙවීම් කටයුතු සිදු කළ යුතු බව, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත.

07. අනුමත ලේඛනයට අනුව ක්ෂේත්‍රයේ මුදල් ගෙවීමෙන් පසු යම් මුදලක් ඉතිරි වූයේ නම්, එම මුදල ඉහත CR පොතේ සටහන් කර සමෘද්ධි බැංකුවට භාරදිය යුතුය. සමෘද්ධි බැංකුව විසින් පොදු ලෙජරයේ "අඩු අදායම්ලාභී පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුමට" බැර පිණිස ලියන ලද "මුදල් බැර" පත්‍රයක් සම්පූර්ණ කර අදාළ මුදල භාරගත යුතුය.

08. වාණිජ බැංකුවෙන් සමෘද්ධි බැංකුව වෙත මුදල් රැගෙන ඒමේදී හා ක්ෂේත්‍රයේ සමාජ ප්‍රතිලාභ මුදල් ගෙවීමේදී ප්‍රදේශයභාර පොලිස් ස්ථානාධිපතිතුමා හා අනෙකුත් ආරක්ෂක අංශ සමඟ සාකච්ඡා කර සුදුසු ආරක්ෂක වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු ය. යම් හෙයකින් රාත්‍රී කාලයේ වැඩි මුදල් ප්‍රමාණයක් සමෘද්ධි බැංකුවේ සේප්පුවේ තැබීමට සිදු වුවහොත් පොලිස් ආරක්ෂාව ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

09. කොරෝනා වෛරසය (Covid - 19) ශ්‍රී ලංකාව තුල ව්‍යාප්ත වීම හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාවට සහන සැළසීම සඳහා සමාජ ප්‍රතිලාභ දිමනා ගෙවීමේදී ග්‍රාමීය කමිටුවේ අනෙකුත් නිලධාරින්ගේ සහය ලබා ගන්නා ලෙස උපදෙස් ලබාදී ඇත. කැපවීමෙන් රාජකාරි කටයුතු කරනු ලබන සියළු නිලධාරීන්ගේ සේවය ඉතා අගය කොට සළකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය - කා.දැ.ස.
2. ජනාධිපති ලේකම් ,ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා - කා.දැ.ස.
3. අග්‍රාමාත්‍ය ලේකම්, ගාමිණී එස්. සෙනරත් මහතා - කා.දැ.ස.
4. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස
5. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය - 2020.04.06 දින ලබා දුන් උපදෙස් අනුව කා.දැ.ස.
6. රාජ්‍ය ලේකම් ,සමාජ ආරක්ෂණ අංශය - කා.දැ.ස.
7. විගණකාධිපති ,විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ස
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
9. අධ්‍යක්ෂ, ක්ෂුද්‍ර මූල්‍ය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
10. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස. සහ අ.ක.ස.
11. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස. සහ අ.ක.ස.
12. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
13. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ස. සහ අ.ක.ස.